**නැතිවූ ජාතික හැඳුනුම්පත් හා ඉලෙක්ට්‍රෝනික උපකරණ පිළිබඳ පැමිණිලි කිරීම.**

**නියමිත සුදුසුකම්**

ශ්‍රී ලංකාව තුල වෙසෙන කවර පුරවැසියෙකු හෝ මෙහි පැමිණි විදේශිකයෙකුට අවශ්‍ය විටදී මෙම සේවාව ලබාගත හැක.

**ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය**

අදාල පොලිස් ස්ථානය වෙත යෑම.

අදාල පුද්ගලයා පැමිණිල්ල ඉදිරිපත් කිරීම සඳහා නියමිත පොලිස් ස්ථානය වෙත යා යුතුය.

ජාතික හැඳුනුම් පත සඳහා අදාල පුද්ගලයා විසින් පොලිස් ස්ථානය වෙත ගොස් (ඔහුගේ/ඇයගේ හැඳුනුම් පත් අංකයදන්නේ නම් එය සඳහන් කරමින්) පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතුය.

**පොලිස් ස්ථානය වැඩ කරන වේලාවන්**

24 / 7 / දින 365

පිටපත් නිකුත් කිරීම

උදේ 8.00 සවස 4.00

**අවශ්‍ය සනාථ කරන ලියකියවිලි**

ජාතික හැඳුනුම් පත – අංකය ඇත්නම් එය

පාස්පෝට් බලපත්‍රය –අංකය ඇත්නම් එය

රියදුරු බලපත්‍රය – අංකය ඇත්නම් එය

චෝදනාවෙහි උද්ධෘත පිටපතක් ලබාගැනිම.

ඔහු / ඇය නැති කරගත් අයිතමයට අදාලව පොලිස් ස්ථානය වෙත කරන ලද පැමිණිල්ලේ උද්ධෘත පිටපතක් එම පොලිස් ස්ථානයෙන් ලබාගත යුතුය.

පැමිණිලිවල උද්ධෘත පිටපත් අවශ්‍ය කරන සමහර දෙපාර්තමේන්තුවල නම් පහත ලැයිස්තු ගත කර ඇත.

| | |
|---|---|
| ජාතික හැඳුනුම්පත | ග්‍රාම නිළධාරි/පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව |
| පාස්පෝට් බලපත්‍රය | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව |
| රියදුරු බලපත්‍රය | මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුව |

ජාතික හැඳුනුම්පත් සඳහ අදාල පුද්ගලයා විසින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ආකෘති පත්‍රයක් අදාල පොලිස් ස්ථානය වෙතින් ලබා ගත යුතුය.

**ඉල්ලුම් පත්‍රය**

ඉල්ලුම්කරු හට පොලිස් ස්ථානයේ දී සම්පුර්ණ කිරීමට කිසිදු ඉල්ලුම් පත්‍රයක් නොමැත.

ඔහෙත් සම්පුර්ණ කර ඉදිරිපත් කිරීම සඳහා අදාල දෙපාර්තමේන්තුව විසින් ඉල්ලුම්පත්‍ර සපයනු ලැබේ.

**කාල නියමයන්**

ජාතික හැඳුනුම් පත්, රියදුරු බලපත්‍ර පාස්පෝට් බලපත්‍ර හා අනෙකුත් ලියවිලි හා ඉලෙක්ට්‍රෝනික උපකරණ නැතිවීමට අදාල පැමිණිලි සම්බන්ධව වූ කාල නියමයන් එක හා සමාන වන අතර එය මෙපරිදිය :

**ක්‍රියාදාම කාල නියමය**

පැමිණිලිවල උද්ධෘත : එක් දිනක් ඇතුලතදී

සම්පූර්ණ ක්‍රියාදාම කාලය ගැටළු යොමු කරනු ලැබූ අදාල දෙපාර්තමේන්තුවල කාර්යක්ෂමතාව අනුව සිදුවේ.

**සේවාව සදහා අදාල මිළ ගණන්**

ජාතික හැඳුනුම් පත්, පාස්පෝට් බලපත්‍ර, රියදුරු බලපත්‍ර හා අනෙකුත් කරුණු පිළිබඳව වූ පැමිණිලිවල උද්ධෘත ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මිල ගණන් එක් පිටුවකට රු 25.00 බැගින් වේ.

**සේවා වගකීම් නියමයන්**

මෙම දෙපාර්තමේන්තුව පිළිබඳව වූ සියළුම මෙහෙයුම් වලදී අදාල පුද්ගලයා විසින් අදාල පොලිස් ස්ථානයෙහි කාර්ය භාර නිලධාරි වෙත වාර්තා කල යුතුය.

**ආදර්ශ දත්තයන් සමග සාම්පල් ආකෘතිය**

රහස්‍ය තොරතුරු හේතුකොට ගෙන පොලිස් ස්ථානය විසින් සපයනු නොලැබේ.

**ආයතනයේ තොරතුරු**

පොලිස් දෙපාර්තමේන්තුව
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

Mr. Lasitha Weerasekara
දුරකථන:+94-11-2421111 /
+94-11-2327711-2-3
ෆැක්ස් අංක:+94-11-234553
විද්‍යුත් තැපෑල:telligp@police.lk
වෙබ් අඩවිය: www.police.lk